අවසන් දිනය - 2025.09.08

# ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **"මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - පළමු අදියර"**හි මතු සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම කොළඹ ස්ථාපිත කර ඇත.

මෙම පත්වීම 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධානවලට යටත් වනු ඇත.

**ව්‍යාපෘතියේ නම - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - පළමු අදියර**

**(ඇමෙරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය)**

| අංකය | තනතුරු නාමය | කළ.සේ. චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් කාණ්ඩය/PS | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | කාර්යාල ඉංජිනේරු | PS - 04 | 02 |
| 02 | වැඩබිම් ඉංජිනේරු | PS - 04 | 02 |
| 03 | පරිපාලන නිලධාරි | PS - 06 | 01 |
| 04 | ප්‍රතිස්ථානගත කිරීමේ නිලධාරි | PS - 06 | 01 |
| 05 | ව්‍යාපෘති ලේකම් | PS - 06 | 01 |
| 06 | සංවර්ධන නිලධාරි | MN 4 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 01 |
| 07 | මූල්‍ය සහකාර | MN 4 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 01 |
| 08 | ගිණුම් සහකාර | MN 4 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 01 |
| 09 | ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර | MN 4 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 04 |
| 10 | පරිගණක ක්‍රියාකරු - සිංහල | MN 2 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 01 |
| 11 | පරිගණක ක්‍රියාකරු-දෙමළ | MN 2 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 01 |
| 12 | කළමනාකරණ සහකාර | MN 2 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 05 |
| 13 | රියදුරු | PL 3 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 04 |
| 14 | කාර්යාල සහායක | PL 1 - 2016 (සහායක කාර්ය මණ්ඩලය) | 03 |

- <u>**කාර්යාල ඉංජිනේරු, වැඩබිම් ඉංජිනේරු (PS 04 කාණ්ඩය) තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්**</u>

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019, ඇමුණුම 01 අනුව, කාර්යාල ඉංජිනේරු, වැඩබිම් ඉංජිනේරු (PS 04) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරුවල මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (1) හෝ (2)]**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

   හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

- එම සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රෙය් අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද

2. රජයේ දීප ව්‍යාප්ත සේවාවක III/II පන්තියේ හෝ එයට වැඩි හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක් දරන නිලධරයකු වීම

   සමග

- III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද

- <u>**පරිපාලන නිලධාරි, ප්‍රතිස්ථානගත කිරීමේ නිලධාරි (PS 06 කාණ්ඩය) තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්**</u>

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019, ඇමුණුම 01 අනුව, පරිපාලන නිලධාරි, ප්‍රතිස්ථානගත කිරීමේ නිලධාරි (PS 06) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරුවල මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (1) හෝ (2) හෝ (3)]**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

   හෝ

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

  හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

  හෝ

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 7 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

  සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක පළපුරුද්ද

2.

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 6 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද

3.

- තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම්වල 5 වන මට්ටමට වඩා නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

සහ

- විශේෂීකරණය වීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද

- **<u>ව්‍යාපෘති ලේකම් (PS 06 කාණ්ඩය) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්</u>**

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019, ඇමුණුම 01 අනුව, ව්‍යාපෘති ලේකම් (PS 06) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (1) හෝ (2)]**

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් තුනකට (3) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 06කින් අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සමග

- පිළිගත් ආයතනයකින් ලේකම්කරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම්වරයෙකු වීමේ විභාග වෙනුවෙන් අධ්‍යයන කටයුතු සිදු කිරීම

සමග

- අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද

3.

- අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් සහිත වරලත් ලේකම්වරයෙකු වීම

- **<u>මූල්‍ය සහකාර, ගිණුම් සහකාර, ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර, සංවර්ධන නිලධාරි (සහායක කාර්ය මණ්ඩලය) (MN 04) තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්</u>**

**<u>යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 අනුව, මූල්‍ය සහකාර, ගිණුම් සහකාර, ප්‍රතිස්ථානගත කිරීමේ සහකාර, සංවර්ධන නිලධාරි (සහායක කාර්ය මණ්ඩලය) (MN 04) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරුවල මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.</u>**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ වන ප්‍රථම උපාධියක්

සමග

- අදාළ ක්ෂේත්‍රයේ වසර 2ක පළපුරුද්ද (සමාන තනතුරක)

- **<u>පරිගණක ක්‍රියාකරු - (සිංහල), පරිගණක ක්‍රියාකරු - (දෙමළ), කළමනාකරණ සහකාර (සහායක කාර්ය මණ්ඩලය) (MN 02) තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්</u>**

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 අනුව, පරිගණක ක්‍රියාකරු - (සිංහල), පරිගණක ක්‍රියාකරු - (දෙමළ), කළමනාකරණ සහකාර (සහායක කාර්ය මණ්ඩලය) (MN 02) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරුවල මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකක් ද ඇතුළුව විෂයන් හතරකට (4) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 06කින් එකවරක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සමග

- එකවරක දී අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වීම

- **රියදුරු (සහායක කාර්ය මණ්ඩලය) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්**

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 අනුව, රියදුරු (සහායක කාර්ය මණ්ඩලය) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- භාෂාව සහ තවත් විෂයක් ද ඇතුළුව විෂයන් දෙකකට (2) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

සමග

- සී සහ සී1 කාණ්ඩ සහිත රියදුරු බලපත්‍රය

**හෝ**

- බී කාණ්ඩය සහිත නව රියදුරු බලපත්‍රය

සමග

- වසර 3ක පළපුරුද්ද

- **කාර්යාල සහායක (සහායක කාර්ය මණ්ඩලය) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්**

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 අනුව, කාර්යාල සහායක, කාර්යාල කම්කරු (සහායක කාර්ය මණ්ඩලය) (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) තනතුරේ මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

- විෂයන් දෙකකට (2) සම්මාන සාමර්ථ්‍ය සහිතව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වීම

**සාමාන්‍ය කොන්දේසි :**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම් පත් යොමු කළ යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධරයන් සඳහා අවුරුදු 60ට අඩු
- අනෙකුත් අයවලුන් සඳහා අවුරුදු 64ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන, සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- පත්වීම ප්‍රදානය කිරීමේ හෝ නොකිරීමේ තීරණය සහ සේවා දිගු ලබා දීම, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදය ප්‍රකාරව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, මූලික උපාධියේ සවිස්තරාත්මක උපාධි සහතිකය (transcript), සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සහිත ව, 2025.09.08 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**

**07. වැඩිදුර විමසීම් සඳහා**

0112887472

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවක සිංහල භාෂා පාඨය බලපැවැත් වේ.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**